# බදාදා

## පළමුවන කියැවීම

දානියෙල් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

දානියෙල් 3 7 14–20, 24–25, 28

**සමිඳාණන් වහන්සේ සිය දූතයා එවා සිය සේවකයන් ගලවා ගත් සේක.**

නෙබුකද්නෙසර් තරුණයන් තිදෙන අමතා මෙසේ කීය. "ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ ඔබ මාගේ දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන්නේ වත්, මා පිහිටුවා තිබෙන රන් රූපයට නමස්කාර කරන්නේ වත් නැතැ යි කියන්නේ ඇත්තද? හොරණෑවේ ද නළාවේ ද වීණාවේ ද මහා වීණාවේ ද කුඩා වීණාවේ ද මිහිරි නළාවේ ද සියලු ආකාර තූර්ය භාණ්ඩවල ද ශබ්දය ඇසෙන විට බිම වැටී මා සාදා තිබෙන රූපයට නමස්කාර කරන්නට ඔබ සූදානම් ද? එසේ නම් යහපති, නැත්නම් රන් රූපයට ඔබ නමස්කාර නොකළොත් එකෙණෙහිම ඇවිළෙන ගිනි උදුනක් මැදට ඔබ හෙළනු ලබනු ඇත. එවිට මාගේ අත්වලින් ඔබ ගලවන දෙවියෝ කවුරු ද කියා බලමු.

ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ රජතුමාට පිළිතුරු දෙමින් මෙසේ කීහ. "දේවයන් වහන්ස, ඔබේ ප්‍රශ්නයට පිළිතුරු දීමට අපට වුවමනා නැත. දේවයන් වහන්ස, ඇවිළෙන ගිනි උදුනෙන් අප ගලවා ගන්නට පුළුවන් දෙවි කෙනෙක් සිටිත් නම් ඒ අප වැඳුම් පිදුම් කරන දෙවියන් වහන්සේ ම ය. ඔබේ අතින් උන් වහන්සේ අප ගලවන සේක. දේවයන් වහන්ස, උන් වහන්සේ එසේ නොකළත් අප ඔබේ දෙවිවරුන්ට වැඳුම් පිදුම් කරන්නේ වත්, ඔබ පිහිටුවා ඇති රන් රූපයට නමස්කාර කරන්නේ වත් නැති බව ඔබට දන්වන්නට කැමැත්තෙමු."

ඒ ඇසූ නෙබුකද්නෙසර් අතිශයින් කෝපාවිෂ්ඨ විය. ෂද්‍රක්, මේෂක්, අබෙද්නෙගෝ වෙත ඔහුගේ මුහුණේ බැල්ම වෙනස් වී ගිනි උදුන සාමාන්‍ය ප්‍රමාණයට වඩා සත්ගුණයක් රත් කරන්නට නියම කළේය. ෂද්‍රක්, මේෂක් හා අබෙද්නෙගෝ බැඳ, ඇවිළෙන ගිනි උදුනට හෙළන්නට ඔහු තමාගේ සේනාවේ ශක්ති සම්පන්න අයට අණ කළේය. නෙබුකද්නෙසර් රජ පුදුමයට පත් වී වහා නැගිට මන්ත්‍රීවරුන් අමතා "අප බැඳ ගින්නට හෙළුවේ මිනිස්සු තුන් දෙනෙක් නොවෙත් දැ"යි ඇසීය. "එසේය දේවයන් වහන්ස" කියා ඔව්හු පිළිතුරු දුන්හ. එවිට රජතුමා "අන්න මිනිසුන් සතර දෙනෙකු සිටිනු මට පෙනේ. කිසි පීඩාවක් නැතිව ඔව්හු ගින්න මැද ඇවිදිති. සතරවැනියා පෙනුමෙන් දේව පුත්‍රයෙකු වැනි ය"යි කීය.

එවිට නෙබුකද්නෙසර් මෙසේ කීවේය. ෂද්‍රක්ගේත් මේෂක්ගේ හා අබෙද්නෙගෝගේත් දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා! මන්ද උන් වහන්සේ සිය දූතයා එවා තමන්ගේ මේ සේවකයන් තිදෙනා ගළවා ගත් සේක. ඔව්හු රජුගේ නියමයට පිටුපා තමන්ගේ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූහ. තමන්ගේ දෙවියන් වහන්සේ හැර අන් දෙවියෙකුට සේවය කරනවාටත්, නමස්කාර කරනවාටත් වඩා ගින්නට ගොදුරු වන්නට ඔව්හු සතුටු වූහ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

දානියෙල් (ද්.ස.ග්‍ර) 1 : 29 – 34

පිළිතුර: මහිමයත් සදා ස්තුතියත් සමිඳුන් හට පුදන්න.

ගීය:

සමිඳුනි, අපේ පියවරුන්ගේ දෙවිඳුනි, ඔබ හට පැසසුම් වේවා!
ඔබ වර්ණනා කරනු ලැබ සදහට ම ඔබ උසස් කරනු ලැබේවා!
ඔබගේ මහිමාන්විත සුවිශුද්ධ නාමයට පැසසුම් වේවා!
එය වර්ණනා කරනු ලැබ සදහට ම එය උසස් කරනු ලැබේවා!

ඔබගේ තේජස් සම්පන්න දෙව් මැඳුර තුළ ඔබ හට පැසසුම් වේවා!
ඔබ උසස් කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ මහිමාන්විත කරනු ලැබේවා!
ඔබගේ රාජ්‍යයේ සිහසුන අරා සිටින ඔබ හට පැසසුම් වේවා!
ඔබ වර්ණනා කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ උසස් කරනු ලැබේවා!

කෙරුබ්වරුන්ට ඉහළින් වැඩ සිටින මහා සමුදුර මතින ඔබ හට පැසසුම් වේවා!
ඔබ වර්ණනා කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට ම ඔබ මහිමාන්විත වේවා! අහස් කුසයෙහි සිටින ඔබ හට පැසසුම් වේවා!
ඔබ උසස් කරනු ලැබ සියල්ලට ඉහළින් සදහට මහිමාන්විත වේවා!

## සාධුකාරය

"උත්ථානය ද ජීවනය ද මම වෙමි. ජීවත්ව සිටින මා අදහා ගන්නා කිසිවෙක් කිසි කලෙක නොමැරෙන්නේ ය"යි ස්වාමීන් වහන්සේ වදාරණ සේක.

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 8 : 31−42

***පුත්‍රයාණෝ ඔබ නිදහස් කරත් නම් ඔබ සැබැවින් ම නිදහස් ය.***

තමන් වහන්සේ අදහාගත් ජුදෙව්වරුන්ට ජේසුස් වහන්සේ කතා කොට "ඔබ මාගේ ධර්මයෙහි පිහිටා පවතින්නහු නම් සැබැවින්ම ඔබ මාගේ ගෝලයෝ ය. ඔබ සත්‍යය අවබෝධ කරගන්නහු ය. සත්‍යය ඔබ නිදහස් කරන්නේ ය"යි වදාළ සේක. ඔව්හු පිළිතුරු දෙමින් "අපි ආබ්‍රහම්ගේ වංශයෙන් වම්හ. කිසි කලෙක කිසිවකුට අපි වහල් නොවීමු. එබැවින් 'අප නිදහස් වනු ඇත' කියා ඔබ කියන්නේ කෙසේ දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. පව් කරන හැම කෙනෙක්ම පාපයට වහලෙකි. වහලෙකුට පවුලේ විසීමට නිත්‍ය හිමිකමක් නැත. එහෙත් පුත්‍රයෙකුට නිත්‍ය හිමිකමක් ඇත. එබැවින් පුත්‍රයාණෝ ඔබ නිදහස් කරන සේක් නම් ඔබ සැබැවින්ම නිදහස් ය. ඔබ ආබ්‍රහම්ගේ වංශයෙන් පැවත එන බව මම දනිමි. එසේ වුව ද ඔබ තුළ මාගේ දහමට ඉඩක් නොවන බැවින් ඔබ මා මරන්නට සොයන්නාහු ය. මාගේ පියාණන් වහන්සේ ඉදිරියෙහි මා දුටු දේ මම පවසමි. ඔබේ පියාගෙන් ඇසූ දේ ඔබ කරන්නාහු ය"යි වදාළ සේක.

“අපේ පියාණෝ ආබ්‍රහම් ය”යි ඔව්හු උන් වහන්සේට පිළිතුරු දුන්හ. උන් වහන්සේ ද ඔබ ආබ්‍රහම්ගේ දරුවෝ නම් ආබ්‍රහම් කළ ක්‍රියා ඔබත් කරනු ඇත. එසේ වුව ද දෙවියන් වහන්සේගෙන් අසා දැනගත් සත්‍යය ප්‍රකාශ කළ මිනිසකු වන මා මරන්නට ඔබ සොයන්නහු ය. ආබ්‍රහම් නම් එසේ කළේ නැත. ඔබ කරන්නේ ඔබේ පියාගේ ක්‍රියා ය”යි වදාළ සේක. එවිට ඔව්හු “අපි අවජාතක දරුවෝ නොවෙමු. අපට ඇත්තේ එකම පියෙකි. එනම් දෙවියන් වහන්සේ ම ය”යි කීහ. ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් “දෙවියන් වහන්සේ ඔබේ පියාණෝ නම් ඔබ මට ප්‍රේම කරනු ඇත. මන්ද මම දෙවියන් වහන්සේ කෙරෙන් පහළ වී දැන් මෙහි සිටිමි. මාගේම කැමැත්තෙන් මා පැමිණියා නොව උන් වහන්සේ මා එවා වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.